ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන අංශය

නීතිවේදී උපාධි පාඨමාලාව -2023/2024

06 වන මට්ටම

LLU 6814 දිලික්ත නීතිය

අවසාන පරීක්ෂණය

කාලය: පැය තුනකි (03)

දිනය: 09.05.2025 වේලාව: ප.ව.1.30-ප.ව. 4.30

මුලු ප්‍රශ්න ගණන -07

ප්‍රශ්න හතරක් (04) සඳහා පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**1.** රෝම නීතිය තුල අපහාසය නම් වරද සලකන ලද්දේ හුදෙක් පීඩාවේ (*injuria*) අනුප්‍රභේදයක් ලෙසට වන අතර ඒ සඳහා වූ ප්‍රතිකර්මය වූයේ ඇක්ටියෝ ඉන්ජුරියාරුම් නඩුකරයයි. පීඩාවේ අනෙක් ප්‍රභේද හා සමාන වන ලෙසට, අපහාසය සඳහා වගකීම මේ අනුව පීඩාවක් කිරීමේ චේතනාව (*animus injuriandi*) ඔප්පු කිරීම මත පදනම් විය. එනම්, පීඩාවක් කිරීමේ චේතනාව වරදකාරි චේතනාවේ (*dolus*) හුදු අනුප්‍රභේදයක් වූ බැවින්, පැමිණිලිකරු වෙත අපහාසය කිරීමේ චේතනාව ඔප්පු කිරීම අවශ්‍ය විය. රෝම ලන්දේසි නීතියේ තත්වය ද මෙයම වූ අතර එහි සාමාන්‍ය අර්ථයෙන් යම් වචන සමූහයක් අපහාසාත්මක වන විට, පීඩාවක් කිරීමේ චේතනාව පවතින බවට උපකල්පනය කෙරුණි.

R. G. McKerron, The *Law of Delict (*7th ed) 1971 at 170.

ඉහත ප්‍රකාශයේ පසුබිම තුල, අපහාසය සඳහා වගකීම සනාථ කිරීමේ දී පීඩාවක් කිරීමේ චේතනාවට අදාල වන පහත පැතිකඩ පිලිබඳ සාකච්ඡා කරන්න.

අ) පීඩාවක් කිරීමේ චේතනාවේ අර්ථය හා එහි සංඝටක (ලකුණු10)

ආ) පීඩාවක් කිරීමේ චේතනාව ඔප්පු කල යුතු පාර්ශවය (ලකුණු 05)

ඇ) පීඩාවක් කිරීමේ චේතනාව නිර්ණය කිරීමේ දී යොදාගත යුතු වන පරීක්ෂණ (ලකුණු 05)

ඈ) අපහාසය පිලිබඳ නඩුකරයක දී අදාල වන විත්තිවාචක (ලකුණු 05)

ඔබගේ පිලිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් සනාථ කල යුතුය.

**2.** 'තමන්ගේ ගබඩා කාමරවල බැරල් ආදිය තබාගෙන සිටින යම් පුද්ගලයන් සිටීද, ඔවුන්ගේ වගකීම වන්නේ ඒවා පෙරලී නොයා බවට වගබලා ගැනීමයි. එවැනි අවස්ථාවක දී, කිසිදු සැකයකින් ඔබ්බට, එය නොසැලකිල්ල පිළිබඳ මුල් බැල්මට සාක්ෂියක් වේ'.

*Byrne v Boadle* (1863) 2 H. & C. 722.

ඉහත ප්‍රකාශයට අදාලව *Res ipsa loquitur* සිද්ධාන්තය සහ එහි අත්‍යවශ්‍ය සංඝටක පිළිබඳව සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර තුල ***Byrne v Boadle***, (1863) 2 H. & C. 722 නඩුව ද ඇතුලුව, අදාල නඩු නීතිය සාකච්ඡා කල යුතු අතර දිලික්ත නීතිය තුල නොසැලකිල්ල තහවුරු කිරීමේ දී මෙම නඩු ඉටු කල කාර්යය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 25)

**3.** රුවන් සහ ඉෂාරා වැලිහේන නම් ගම්බද නාගරිකයේ නිශ්ශබ්ද ගෙයක පදිංචියට ගියහ. මහනුවර නගරයේ වූ අධික ධූවිලි සහගත වාතාවරණය නිසා ඉෂාරාගේ බරපතල පීනස් රෝග තත්වය උග්‍ර වන නිසාය ඔවුන් මේ තීරණය ගත්තේ. ඔවුන්ගේ නව නිවස පිහිටියේ නිම්නයේ දසුන මන්සකාන්ත ලෙස පෙනෙන කන්දකය. මෙම නිවෙස සතුව ගෙවත්තක් වූ අතර ඉෂාරා එහි කුඩා කාබනික ඖෂධීය වගාවක් පවත්වාගෙන ගිය අතර හාවුන් කීප දෙනෙක් ද ඇති කළාය.

යාබද ඉඩම අයිතිව තිබුණේ සුරේන්ටය. නව පවුල පැමිණ සති කීපයකට පසුව, සුරේන් තම ඉඩමේ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපොලක් ආරම්භ කළේය. උදේ සිට ආරම්භ වන පිරිද්දීම, පිරිස්සුම් කිරිම හා ඇංජිම් ක්‍රියාත්මක කිරිම නිසා ඇත වන ශබ්දය සවස් වන තෙක් පවතී. භාවිතා කරන ලද තෙල් හා ග්‍රීස් නිතර යාබද ඇලකට යොමු කරන ලද අතර මෙම ඇල ඉඩම් දෙක අතරින් ගලන එකකි. රුවන් ඖෂධ උයන සඳහා ජලය සපයා ගැන්මට පුරුදුව සිටියේ මෙම ඇලෙනි. එහෙත් මෙම ඇල මේ වනවිට බෙහෙවින් දූෂණයට ලක්ව තිබුණි.

ඉඩමේ අනෙක් පස ජීවත් වූ කුමාරි තමාට දෙමාපියන්ගෙන් උරුම වූ කුකුලු හා එලු ගොවිපොලක් තම පවුල සමග පවත්වාගෙන ගියාය. දශකයකට අධික කාලයක් තිස්සේ ඇය මෙම සතුන් නඩත්තු කල අතර එලුවන්ගේ මල පහ නිසා ඇති වූ දුගඳ සහ කුකුලු කොටුවලින් පැන නැංග ධූවිලි ගතිය නිසා ඉෂාරාගේ අසනීප තත්වය නැවත ඉස්මතු විය. මෙම සතුන් පාන්දර කෑ ගැසීම නිසා වැලිහේනට පදිංචියට එන විට යුවල අපේක්ෂා කල නින්ද හා සාමකාමී පරිසරය ද බාධාවට ලක්විය.

රුවන් තම අසල්වැසියන් දෙපොල සමග අවස්ථා කීපයක දී කථා කළ අතර යම් එකගතාවයක් ඉල්ලා සිටියේය. එහෙත් සුරේන් ඊට ප්‍රතිචාර දැක්වූයේ පසමිතුරු ස්වභාවයෙනි. පලිගැනීමක් ලෙස හේ දැන් සිතාමතාම නිස්කලංක වේලාවල වැඩියෙන් ශබ්ද කරයි. එක්තරා සන්ධ්‍යාවක, සුරේන්ගේ

වැඩපොලෙහි තෙල් කන්ටේනරයක් හදිසි අනතුරක් නිසා ගිනිගත් අතර මේ නිසා කුඩා පිපිරීමක් ඇති විය. මෙම ගින්න වේගයෙන් පැතිර ගිය අතර, රුවන් හා ඉශාරාගේ ඖෂධ උයනේ කොටසක් ද, ඔවුන් උපකරණ තබා තිබූ ගබඩා කාමරයට ද ඒ නිසා හානියට පත්විය.

සූරේන් හා කුමාරිට එරෙහිය දිලික්තමය නඩුකරයක් පැවරිය හැකිද යන්න පිලිබඳ රුවන් හා ඉශාරා ඔබගෙන් උපදෙස් පතයි. ඔවුන්ට උපදෙස් දෙන්න. ඔබගේ පිලිතුර විනිශ්චිත නඩු තීරණ මගින් සනාථ කල යුතුය. (ලකුණු 25)

4. '....අන්තරාකාරී පරිශ්‍රයක පාලනය තිබෙන අයට, එම පරිශ්‍රයට පැමිණෙන පුද්ගලයන් සම්බන්ධව ඔවුන්ගේ ආරක්ෂාවට අදාල සාධාරණ රැකවරණය සැලසීම සම්බන්ධ යුතුකමක් තිබේ යැයි පැවසිය හැක'.

R. G. McKerron, *The Law of Delict*, (7th ed) 1971, at 240.

අන්තරාකාරී පරිශ්‍රයන් (dangerous premises) හා සම්බන්ධ වාසය කරන්නාගේ වගකීම පිලිබඳ අදාල නඩු තීන්දු හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 25)

5. සමන් ග්‍රීන් සිටි සුපර් මාකට් නම් වූ, සතිය පුරාවට පැය විසි හතරම සේවය සපයන වෙලඳ සැලෙහි අයිතිකරුවාය. පරිශ්‍රයේ පිරිසිදුකම පවත්වාගෙන යනු පිණිස, හේ මාස්ටර්ස් ක්ලීනර්ස් ප්‍රයිවට් ලිමිටඩ් නම් පිරිසිදු කිරීමේ සමාගම සමග ගිවිසුමක් ඇති කරගත් අතර මෙම ආයතනයේ සේවකයන් පැය අටේ වැඩ මුර අනුව සේවය සපයති. සේවා ගිවිසුම අනුව පිරිසිදු කරන්නන් සුපිරි වෙලඳ සැල් පරිශ්‍රය සෑම මිනිත්තු තිහකට වරක්ම පරීක්ෂා කල යුතු අතර යම් කිසි අපිරිසිදු වීමක් වේ නම් හෝ අතපසු වූ යමක් වේ නම් එය වහා නිවැරදි කල යුතුය.

2018 ඔක්තෝබර් මස, සුපුරුදු පාරිභෝගිකයෙක් වූ රමණී ඉවුම් තෙල් මිලදී ගැනීම සඳහා වෙලඳසැලට ආවාය. 'මූලූතැන්ගෙයි අත්‍යවශ්‍ය භාණ්ඩ' නම් වූ කොටස වෙත ඇය ඉක්මනින් ගමන් කලේ තම දියණිය පාසලෙන් ගත යුතු වේලාව පසු වී තිබුණු නිසාය. පොලොව මත වූ තෙල් පදාසයක් මත ඇය ලිස්සා ගියාය. මෙම ඇද වැටීම නිසා ඇයගේ හිස බරපතල ලෙස තුවාල වූ අතර, මාස හයක කාලයක් ඇඳ මත ගත කිරීමට ඇයට සිදුවිය.

මෙම සිදුවීමට පසුව, සමන් අභ්‍යන්තර පරීක්ෂණයක් කැඳවිය. එහි දී ඔහු අනාවරණය කරගත්තේ මාස්ටර් ක්ලීනර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ සේවකයෙක් වූ නිමල්ට අදාල සිද්ධිය වූ දිනයේ මෙම නිශ්චිත කොට පිරිසිදු කිරීම භාර වී තිබූ බවයි. සීසීටීවී දර්ශන බලන විට පෙනී ගියේ අනතුර සිදුවීමට දල වශයෙන් විනාඩි හතලිස් පහකට පෙර සිටම තෙල් වැටී බිම අපිරිසිදු වී තිබුණු බවයි.

තමාට වූ හානියට වන්දි ඉල්ලමින් නඩු පැවරීමට රමණී අපේක්ෂා කරයි. ඉහත කී සිද්ධියට අදාලව, පාර්ශවයන්ගේ ප්‍රතිපුරුෂ වගකීම සම්බන්ධව රමණීට උපදෙස් දෙන්න. ඔබගේ පිළිතුර තුල මෙම නඩුවේ විත්තිකරුවන් විය හැකි පිරිස් කවුදැයි හඳුනාගත යුතු අතර ඔවුන්ගේ වගකීම සාකච්ඡා කල යුතුය. ඔබගේ පිළිතුර අදාල නඩු නීතිය සහ නීතිමය සිද්ධාන්ත ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 25)

6. නිමල් පදික වේදිකාවේ ගමන් කරමින් සිටින විට, ඔහුට භයානක රිය අනතුරක් අත් දකින්ට සිදුවිය. එම අවස්ථාවේ පාර පනිමින් සිටි ඔහුගේ බිරිඳ වේගයෙන් එමින් පැවැති රථයක හැපී ක්ෂණිකව මරු මුවට පත්වූවාය. මෙම මුලු සිද්ධිය සිද්ධ වූයේ නිමල්ගේ ඇස් ඉදිරිපිටය. ඇය වෙත හේ දිව ගිය නමුත් ඇය ඒ වනවිටත් මිය ගොස් සිටියාය. මෙම සිද්ධියට පසුව, නිමල් බරපතල ලෙස විශාදයට ගොදුරු වූ අතර පශ්චාත් ක්ෂතිමය ආතති ආබාධයට (PTSD) ලක් වූවාය. මේ සඳහා අඛන්ඩව මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර හා බෙහෙත් ලබාදීම අවශ්‍ය විය. මෙම තත්වය නිසා යලි වැඩට පැමිණීමට ඔහුට නොහැකි විය.

රිය අනතුර දකින්ට සිදුවීම නිසා තමාට මුහුණ දෙන්ට සිදු වූ මානසික පීඩාව සම්බන්ධව නොසැලකිලිමත් රියැදුරුගෙන් වන්දි ඉල්ලීමට නිමල් අපේක්ෂා කරයි. නිමල්ට දිලික්ත නීතිය යටතේ ස්නායු කම්පනය සඳහා සාර්ථක ලෙස වන්දි ඉල්ලීමට අවස්ථාව පවතීද? සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර විනිශ්චිත නඩු තීරණ මගින් සනාථ කල යුතුය. (ලකුණු 25)

7. 'කන්‍යා දූසණය එහි සාමාන්‍ය හා නීතිමය යන අර්ථයන් දෙකෙහිදීම, යම් ආකාරයක නොමග යැවීමක් අන්තර්ගත කරගනී. තවද ගැහැණු දරුවෙක් කන්‍යා දූෂණයට ලක්කරන පුද්ගලයා ඇයගේ කන්‍යාභාවය අහිමි වීම සම්බන්ධව වන්දි ගෙවීමට බැඳී සිටින අතර, ඇයගේ වෛවාහක සම්භාවිතාවයට සිදු වූ හානියට ද වන්දි ගෙවිය යුතු වෙයි'.

R. G. McKerron, *The Law of Delict*, (7th ed) 1971, at 240.

ඉහත ප්‍රකාශයේ පසුබිම තුල කන්‍යා දූෂණයට අදාල පහත පැතිකඩ සාකච්ඡා කරන්න.

ආ) කන්‍යා දූෂණය යන්නෙහි අර්ථය හා එහි සංඝටක (ලකුණු 05)

ආ) කන්‍යා දූෂණය ඔප්පු කල යුතු පාර්ශවය (ලකුණු 05)

ඇ) කන්‍යා දූෂණය සඳහා පවත්නා විත්තිවාචක (ලකුණු 15)

ඔබගේ පිළිතුර නඩු තීන්දු නීතිය මගින් සනාථ කරන්න.

***හිමිකම් ඇවිරිණි***